(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 371.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 ජූනි මස 19 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2642/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල කාන්තාවන් විසින් මූලිකත්වය දරනු ලබන පවුල්වලට සුදුසු ආර්ථික ක්‍රියාවලියකට යොමු වීම සඳහා එක් පවුලකට රුපියල් ලක්ෂ 2කට නොවැඩි වූ ණය මුදලක් සහන පොලියක් යටතේ ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3236/'12

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3591/'13

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට භාවිතා කරනු ලබන දුරකථන සංඛ්‍යාව රටේ මුළු ජනගහනයටත් වඩා වැඩි බවට පළවන වාර්තා පිළිගන්නේද;

(ii) මේ වන විට දිවයින තුළ පරිහරණය කරනු ලබන ජංගම සහ ස්ථාවර දුරකථන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ආනයනය කර ඇති ජංගම සහ ස්ථාවර දුරකථන සංඛ්‍යාව කොපමණද;

(ii) ගෙන්වනු ලැබූ රටවල් අනුව එම දුරකථන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගෙවුම් ශේෂ ලේඛනයෙහි හිඟය කෙරෙහි දුරකථන ගෙන්වීම සඳහා වැයවන විදේශ විනිමය දැඩි බලපෑමක් ඇති කරවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) රට තුළට ප්‍රමිතියෙන් තොර දුරකථන ගෙන්වනු ලබන බව දන්නේද;

(iv) එය නැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3699/'13

4.

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් මෙට්‍රික් ටොන් එකක් ආනයනය කරන ලද සාමාන්‍ය මිල (CIF VALUE);

(ii) මෙට්‍රික් ටොන් එකක ආසන්න වශයෙන් අඩංගු පෙට්‍රල් ලීටර් සංඛ්‍යාව;

(iii) ඒ අනුව 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් ලීටරයක් වරායෙන් ගොඩබාන විට තිබූ සාමාන්‍ය මිල;

(iv) පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අය කරනු ලබන එක් එක් බදු ප්‍රමාණයන්;

(v) පෙට්‍රල් ලීටරයකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබන ලාභය;

(vi) පෙට්‍රල් ලීටරයක් බෙදා හැරීමේ වියදම හා අලෙවි කිරීම මගින් පිරවුම් හල ලබන ලාභය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3827/'13

5.

ගරු පී. හැරිසන් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියතිත්තවැව මාර්ගයේ නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකර තිබේද;

(ii) එම එක් නිවසක් ඉදිකර ගැනීමට නිවාසලාභියකුට ලබා දුන් මුදල කොපමණද;

(iii) එම මුදල ලබා දුන්නේ ආධාර වශයෙන්ද; නැතහොත්, ණය මුදලක් වශයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නිවාසලාභීන්ට,

(i) ලබා දී ඇති ඉඩම් කට්ටියක වර්ග ප්‍රමාණය කවරේද;

(ii) එම ඉඩම්වල සින්නක්කර අයිතිය ලබා දී තිබේද;

(iii) පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමට වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම යෝජනා ක්‍රමයේ,

(i) ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට පදිංචිය සඳහා ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට පදිංචි නොවී ඇති නිවාස සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4335/'13

6. ගරු අනෝමා ගමගේ මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I, II, සහ III යන පන්තිවල පවතින තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තිය සඳහා නිලධාරීන් බඳවා ගැනීමට පවත්වනු ලබන විවෘත තරග විභාගය අවසන් වරට පැවැත්වූ දිනය කවරේද;

(iii) එම විභාග ප්‍රතිඵල මත නිලධාරීන් තෝරා පත්කළ දිනය කවරේද;

(iv) එම අවස්ථාවේදී ලබාදුන් පත්වීම් සංඛ්‍යාව කොපමණද;

(v) එම පත්වීම් ලද නිලධාරීන් අතර සිටි කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තිය සඳහා නිලධාරීන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය අවසන් වරට පවත්වනු ලැබූ දිනය කවරේද;

(ii) එම විභාග ප්‍රතිඵල මත නිලධාරීන් බඳවා ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, නිලධාරීන් බඳවා ගැනීමට අපේක්ෂිත දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4508/'13

7. ගරු අබ්දුල් හලීම් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ පහළොවකට ආසන්න කාලය තුළ විවිධ අවස්ථාවලදී වර්ෂාව නිසා අකුරණ නගරය ජලයෙන් යට වූ බවත්;

(ii) නගරය ජලයෙන් යටවීම හේතුවෙන් ව්‍යාපාර ස්ථානවලට හා නගරවාසීන්ට අතිවිශාල අලාභයක් සිදු වී ඇති බවත්;

(iii) අකුරණ නගරය ජලයෙන් යට වූ අවස්ථාවලදී යාපනය - මහනුවර මාර්ගය (A9) භාවිතා කිරීමට නොහැකි වූ බවත්;

(iv) 1997 වර්ෂයේදී අකුරණ නගරය ජලයෙන් යට වූ අවස්ථාවේදී නිලධාරීන්ගේ උපදෙස් අනුව නගරය ඔස්සේ ගලා යන ඇළ මාර්ගය අවහිර වන ලෙස ඉදිකර තිබූ ගොඩනැගිලිවල කොටස් ඉවත් කළ බවත්;

(v) අකුරණ මහ පල්ලියේ සහ ප්‍රදේශවාසීන්ගේ ආධාරයෙන් රුපියල් මිලියන 5ක පමණ වියදමෙන් එකී ඇළ මාර්ගයේ රොන් මඩ දෙවතාවක් ඉවත් කළ බවත්;

(vi) එමෙන්ම ඇළට යාබදව තිබූ සියලුම ලී මෝල් ඉවත් කරන ලද බවත්;

(vii) එසේ වුවද, 2013 ඔක්තෝබර් මස 31 වැනි දින ඇද හැලුණු වර්ෂාවෙන් අකුරණ නගරය නැවත ජලයෙන් යට වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අකුරණ නගරය ජලයෙන් යටවීමේ ගැටලුව විසඳීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ මූලිකත්වයෙන්, අනෙකුත් අමාත්‍යාංශ ද සම්බන්ධ කර ගෙන යම් අධ්‍යයනයක් කර තිරසාර පිළියමක් යෙදීමට ක්‍රියා කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4588/'13

8.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූදු බදු සහ අනෙකුත් ආශ්‍රිත බදු ගෙවීම පිණිස ''මරීනා කලම්බු'' හෝ වෙනත් සමාන නමකින් ''කැසිනෝ'' ආයතනයක් ලියාපදිංචි කොට තිබේද;

(ii) එම ආයතනය පළමු වරට ලියාපදිංචි කොට තිබෙන්නේ කවදාද;

(iii) ඉහත කී කැසිනෝ ආයතනය ලියාපදිංචි කොට තිබෙන්නේ කවර නාමයක් (පුද්ගලයකු හෝ සමාගමක්) යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4598/'13

9.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ, පුත්තලම අධ්‍යාපන කලාපයට අයත්, වප/පු/කොයියාවඩි මුස්ලිම් මහ විද්‍යාලේ විද්‍යාව සහ ගණිතය යන විෂයයන් සඳහාත්, ප්‍රාථමික අංශයටත් අවශ්‍ය ගුරුවරුන් නොමැති බවත්;

(ii) එම තත්ත්වය එකී පාසලේ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධාවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලට අවශ්‍ය ගුරුවරුන් නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4652/’13

10.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ගම්පහ දිස්ත්‍රික්කය හැර අනෙකුත් ප්‍රදේශවල ඇති ඩිපෝ සහ වෙනත් භූමි තුළ ධාවනයේ නොයොදවා ගාල් කර ඇති බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ ධාවනයෙන් ඉවත් කර තැබීමට හේතු කවරේද;

(iii) ඉන් කොපමණ ප්‍රමාණයක් නැවත ධාවනයේ යෙදවිය හැකි තත්ත්වයක පවතින්නේද;

(iv) එසේ ධාවනය කළ හැකි බස් රථ අලුත්වැඩියා කළ යුතු නම්, ඒ සඳහා වැයවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4752/’14

11.

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, මල්ලවපිටිය සිට රිදීගම දක්වා මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කරන්නේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2647/’12

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන්වන පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින ඉඩම් නොමැති රජයේ සහ සංස්ථා සේවකයින්ට නිවාස ඉදිකර ගැනීම සඳහා පර්චස් 10කට නොඅඩු ඉඩම් කැබලි 25,000ක් බෙදා දී තිබේද;

(ii) එසේ නම්, මේ වන විට එලෙස ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3237/’12

13.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා සතොස ආයතනයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3651/'13

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3714/'13

15.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලින් අධ්‍යාපන ආධාර ලබා දීම සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබූ පදනම කවරේද;

(ii) ඒ අනුව පසුගිය වර්ෂ 03 ක කාලය තුළ අධ්‍යාපන ආධාර ලබා දීම සඳහා තෝරා ගන්නා ලද සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආධාරලාභීන්ගේ නම් සහ එක් එක් පුද්ගලයාට ලබා දුන් ආධාර මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ශ්‍රී ලංකාවාසීන් එක් ජාතියක් ලෙස ජීවත්වීම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය දේශපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2013 ජුනි මස 21 වැනි දින ගරු කථානායකතුමා විසින් පත්කරන ලද ශ්‍රී ලංකාවාසීන් එක් ජාතියක් ලෙස ජීවත්වීම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය දේශපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමන් විසින් නිරීක්ෂණය කරනු ලබන කරුණු, 2011නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මගින් නියම කර ඇති කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින් එම කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2014 දෙසැම්බර් මස 21 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 හා 157(5) වැනි වගන්ති සමග කියවිය යුතු, 527 වැනි වගන්තිය යටතේ, සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) පනත සමග කියවිය යුතු, 1891 අංක 16 දරන (123 වැනි අධිකාරය වූ) සමිති ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 දෙසැම්බර් 18 දිනැති අංක 1841/8 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ සහ 2014 ජනවාරි 27 දිනැති අංක 1847/2 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබූවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබූවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

10.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14.

ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**